

LH

# 7

# අමතර උපකරණ හා උපාංග

කැමරාවක් භාවිතයේ දී ඇතිවන යම් සීමාවන් ජය ගැනීම සඳහා ද වඩා හොඳ ඡායාරූපයක් නිර්මාණය කිරීම සඳහා ද කැමරාව ආරක්ෂා කර එය මනාව පවත්වාගෙන යාම සඳහා ද ඡායාරූප ශිල්පියෙක් අමතර උපකරණ හා උපාංග ගණනාවක් භාවිතයට ගනී. මෙයින් ප්‍රධාන වන ආලෝක උපකරණ පිළිබඳව ඉදිරි පරිච්ඡේදවලදී සාකච්ඡා කෙරෙනු ඇත. එයට අමතරව නිතරම භාවිත කරන්නට සිදුවන උපකරණ හා උපාංග කීපයක් විස්තර කිරීම මෙහිදී සිදු වේ.

කැමරාවක් භාවිත කරන්නෙකු හා ඡායාරූප ශිල්පියෙකු අතර වෙනස ද මෙම අමතර උපකරණ භාවිතයෙන් පෙන්නුම් කෙරේ. කැමරාවක් භාවිත කරන්නා සතුව ඇත්තේ හුදු කැමරාවක් පමණි.

## ත්‍රිපාද

වඩාත් ප්‍රචලිත උපාංගය ත්‍රිපාදය වේ. ඡායාරූප ගැනීමේ දී කැමරාව ස්ථාවරව තබා ගැනීමට ත්‍රිපාදය පමණක් භාවිත කරන ශිල්පීහු සිටිති. නමුත් ත්‍රිපාදය භාවිත කිරීමේ අරමුණ ඒ අයුරින්ම ඉටුකර ගැනීමට එය දුරස්ථ පාලකය (Remort controller) ද සමඟ භාවිත කිරීම යෝග්‍ය.